පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල්

නර්තනය

වාරය - 2

ශ්‍රේණිය - 12

මංජුක පුෂ්පකුමාර
ර/ ඇහැ /ධර්මපාල ම.වි

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

## කාර්ය පත්‍රිකාව - 20 වන සතිය

- **නිපුණතාව 0.5 - ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනා වල පසුබිම අධ්‍යයනය කරමින් ගායනා කුසලතා ප්‍රදර්ශනය කරයි**
- **නිපුණතා මට්ටම 5.3 - උඩැක්කි, පන්තේරු නැටුම් හා සබැඳි කවි ගායනය කරයි**

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) කවි ගායනා වල සඳහන් වන පරිදි පන්තේරුව නිර්මාණය කළ ඇත්තේ
(i) කතරගම දෙවියන්ගේ ආභරණයක් අනුසාරයෙනි
(ii) සමන් දෙවියන්ගේ ආභරණයක් අනුසාරයෙනි
(iii) විශ්ණු දෙවියන්ගේ ආභරණයක් අනුසාරයෙනි
(iv) පත්තිනි දෙවියන්ගේ ආභරණයක් අනුසාරයෙනි
(v) දැඩිමුණ්ඩ දෙවියන්ගේ ආවරණයක් අනුසාරයෙනි

(02) ''අනේ මී මැස්සේ මල් රොන් ගෙන යන රිස්සේ'' යන කවි පදය අයත් වන්නේ
(i) වරම් කවි වලටය
(ii) පන්තේරු කවි වලටය
(iii) බඹර කවි වලටය
(iv) උඩැක්කි කවි වලටය
(v) ගොයම් කවි වලටය

(03) උඩැක්කි කවියක පදයක් ඇතුළත් වරණය තෝරන්න
(i) සුගත් දහම් සඟ රත්නෙ වැඳිල්ලා
(ii) ලාවට සිරියැල් රත්නිල් මෙබඳු
(iii) සේලයේ ඉනවට ඇඳගත් නැනෝ
(iv) ලකල මාතා අඟන ලකසිරි
(v) අනේ මී මැස්සේ මල් රොන් ගෙන යන රිස්සේ

(04) උඩැක්කිය යොදා ගනිමින් කවි ගායනා කරනු ලබන සබරගමු ශාන්තිකර්ම දෙකකි
(i) කුමාර සමයම හා කිරිමඩුව
(ii) කිරි මඩුව හා ගී මඩුව
(iii) පහන් මඩුව හා හැල්ලුම් මඩුව
(iv) පහන් මඩුව හා ගී මඩුව
(v) පූනා මඩුව හා පහන් මඩු

(05) ඒ බුදු රැස් කඳ තුන්ලොව විහිදූ - ඒ බුදු මඟුලට ආ සැඬ දෙවිඳු
........................................................................................ - මෙලෙස උඩැක්කිය ගෙන දුන් දෙවිඳු

මෙම කවියේ තුන්වන පද පේළිය වන්නේ

(i) කඳවට ලියවැල් දමමින් පසිඳු
(ii) බඳවට ගනිමින් වයමින් මෙබඳු
(iii) ලාවට ලියවැල් රත්තිල් මෙබඳු
(iv) සබයට බසිමින් රඟමින් කිවිඳු
(v) ලාවට සිරියැල් රත්තිල් මෙබඳු

**හිස්තැන් පුරවන්න**

(01) පන්තේරු නැටුම .......................................................................... නර්තන සම්ප්‍රදායට ආවේණික වූ නර්තන අංගයකි.

(02) පන්තේරු කවි ගයමින් නැටීම විහාරස්ථානවල සිදු කෙරෙන 1.......................................................................... 2.......................................................................... 3.......................................................................... ආදී උත්සව අවස්ථා වලදී දක්නට ලැබේ

(03) උඩැක්කිය මුලින්ම .......................................................................... වෙනුවෙන් වාදනය කළ බව කවි ගායනාවලින් කියවේ

(04) උඩැක්කි කවි ගායනා කරනු ලබන්නේ .......................................................................... තාලයටයි

(05) පහන් මඩු ශාන්තිකර්මයේ .......................................................................... නමැති පෙළපාලි අංගයේ ආශිර්වාද කවි ගායනයේ දී උඩැක්කිය යොදා ගනී

## II කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

(01) පහත කවි පද ගායනා කරනු ලබන තාල රූප අනුව ප්‍රස්තාර කරන්න

(i) සැපත පැමිණි මුළු ලොවට සියල්ලේ - ලොවට සියල්ලේ
විපත නොවන කවි පද මෙ සියල්ලේ - පද මෙ සියල්ලේ

(ii) අනේ මී මැස්සේ මල් රොන් ගෙන යන රිස්සේ
රුං රුං ගාමින් ඉගිලෙන ගුම් ගුම් නදයෙන් පැණි බොන

(iii) සුගත් දහම් සඟ රත්නේ වැඳිල්ලා
රගත් සුරන් සැම දෙවි ඇදහිල්ලා

(iv) පෙර බුදු මඟුලට ගෙනා උඩැක්කිය
ඒ බුදු මගුලට ගැසූ උඩැක්කිය

(02) උඩැක්කි හා පන්තේරු නැටුම් වල ගායන තුළ මෙන්ම නර්තනයේද සුවිශේෂීතා දක්නට ලැබේ. උදාහරණ සහිතව විස්තර කරන්න

(03) උඩැක්කි හා පන්තේරු කවි ගායනා මගින් ආගමික පසුබිම පිළිබිඹු කෙරේ. උදාහරණ සහිතව විස්තර කරන්න